# ලෝකාලෝකය

2018 මැයි - ජූලි කලාපය



මම පළමුවෙනියා
සහ අන්තිමයාය.
ජීවමාන තැනැත්තාය.
මම මැරුණෙමි.
නමුත් බලව
මම දැන් සදාකාලයටම
ජීවත්ව සිටිමි.
යේසුස්වහන්සේ කියන සේක.
(එළිදරව් 1:17-18)


**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**

අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.

දුරකථන අංක : 011 2581901

ළමා පිටුව

# අභියෝගයක්



ආදරණීය දුවේ, පුතේ, අපි දැන් 2018 අලුත් වර්ෂයට ඇවිදින්. මේ අලුත් අවුරුද්දේදී සපුරාග න්නට ඔයාට අරමුණු ගොඩාක් තියෙනවා නේද? දිනපතාම පාසල් යෑම, විභාගයට හොඳ ලකුණු ගැනීම, පන්තියේ පළමුවෙනියා වීම වගේ ගොඩාක් අභියෝග තියෙනවා ජය ගන්න. මේ හැම හොඳ අරමුණක් එක්කම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයෙන් තෝරාගත් අනර්ඝ පුරුද්දක් මම අද ඔබට ඉදිරිපත් කරනවා. මේ වටිනා පුරුද්ද ගැන ඔයාලා හොඳින් ඉගෙනගෙන ඔයාලගේ ජීවිතයටත් එකතුකර ගන්න.

**"උන්වහන්සේ තමන් වැඩුණු නුවරවූ නාසරෙත්ට පැමිණ, තමන්ගේ පුරුද්ද ලෙස සබත් දවසෙහි සිනගෝගයට ඇතුල්ව, කියවන පිණිස නැගුටුණු සේක" (ලූක් 4:16).**

ඉහත බයිබල් පදයේ සඳහන් "තමන්ගේ පුරුද්ද ලෙස සබත් දවසෙහි සිනගෝගයට ඇතුල්ව" යන කොටස ඔබ දුටුවා නේද? දුවේ, පුතේ යේසුස්වහන්සේ පුරුද්දක් ලෙස සෑම සබත් දවසකම සිනගෝගයට ගියා. ඔයාලා දන්නවද සිනගෝගය කියන්නේ මොකක්ද කියලා. සිනගෙ ෝගය කියන්නේ යේසුස්වහන්සේ මේ පොළොවේ ජීවත් වුන කාලයේ බයිබලය කියවන්න, ඉගෙන ගන්න ඇදහිලිවන්තයන් එකතු වුණ ස්ථානයට. හරියට අද අපේ සභාව වගේ. **ලූක් 4:16** හි සඳහන්ව තිබෙන පරිදි යේසුස්වහන්සේත් කුඩා කල සිටම සිනගෝගයට යන්න පුරුදු වෙලා හිටියා. හරියට ඔයාලා දෙමව්පියන් එක්ක සභාවට එනවා වගේ.

සභාවේදී යාච්ඤා කිරීම, බයිබලය කියවීම, බයිබලය ඉගෙන ගැනීම, නමස්කාර කිරීම වගේ බොහෝ දේවලට ඔබ උනන්දුවෙන් හා ආශාවෙන් සහභාගී වෙනවාද? නැත්නම් ඔබේ දෙමව්පියන් කියන නිසා හෝ වෙන අයට පේන්න හෝ දෙමව්පියන් සතුටු කරන්න ඕන නිසා සහභාගී වෙනවාද? ආදර දුවේ, පුතේ, යේසුස්වහන්සේව සතුටු කරන්නට අපේ මුළු හදවතින්ම හා උනන්දුවෙන් තමයි අපි සභාවට ගොස් සහභාගීකම් පවත්වන්න ඕනේ. ඔයාලගේ පුංචි වයසේදී ඔයාලට කරන්න තියෙන වැඩ කටයුතු, ජයගන්නට තිබෙන අභියෝග අතරේ "සෑම ඉරිදාම මම සභාවට යනවා" කියන මේ වටිනා අරමුණ අභියෝගයක් ලෙස භාරග න්න ලෙස පුංචි ඔයාලට නැවතත් ආදරයෙන් ආරාධනා කරනවා. මේ අලුත් අරමුණ පුරුදු වීම තමයි මේ අලුත් වර්ෂයේ ඔබට ලැබෙන අනර්ඝ අභියෝගය.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙන් සභාවේ සහභාගීකම ඔබේ ජීවිතයේ වටිනා පුරුද්දක් කර ගැනීමට අපගේ දෙවිපියාණන්වහන්සේගේ කරුණාව ඔබලා සමඟ වේවා !

මීට,

ආදර,

**ශෂිලා නැන්දා.**

# ශ්‍රේෂ්ඨ යේසුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය

## ක්‍රිස්තුස්වහන්සේගේ චරිතයේ ශ්‍රේෂ්ඨත්වය.

**"මම සිතින් මෘදුව යටත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටට ගෙන, මාගෙන් ඉගෙන ගනිල්ලා" (මතෙව් 11:29).**

අද අප යේසුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වයේ තවත් පැතිකඩක් දෙස බලමු. එනම් උන්වහන්සේගේ උත්තරීතර වූ ශ්‍රේෂ්ඨ චරිතයේ ගති ලක්ෂණ හඳුනාගන්න උත්සහ කරමු. **"මම සිතින් මෘදුව යටහත්ව සිටිමි"** යැයි උන්වහන්සේම පැවසූ සේක. පාවුල්තුමා **රෝම 15:3** හි මෙසේ සඳහන් කරයි. **"ක්‍රිස්තුස්වහන්සේ තමන්ම සතුටු කර නොගත් සේක"**. එසේම **1 පේත්‍රුස් 2:23** මෙසේ ලියවී ඇත. **"උන්වහන්සේ නින්දා කරනු ලැබූ කල නින්දා නොකල සේක. වද වින්ද කල තර්ජනය නොකර ....."** මේ ආකාරයෙන් යේසුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨ චරිතය හා ජීවිතය පිළිබඳ බයිබලය පුරාවට ලියවී ඇත. ඒ අතරින් මෙහි මා තෝරාගත් උන්වහන්සේගේ චරිත ලක්ෂණ කිහිපයක් පහත සඳහන් කරමි. යේසුස්වහන්සේගේ අනුගාමිකයන් වන ඔබත් මාත් තුල එම චරිත ලක්ෂණ වර්ධනය වේවායි යාච්ඤා කරමි.

## 01 උන්වහන්සේ ශුද්ධයි. (1 පේත්‍රුස් 1:15-16)

**"නුඹලා කැඳවූ තැනැන්වහන්සේ ශුද්ධව සිටින්නාක්මෙන් නුඹලාත් ශුද්ධව සිටපල්ලා..."**

යේසුස්වහන්සේගේ ජීවිතය පුරාවටම ශුද්ධාත්මයාණන්වහන්සේ ක්‍රියා කිරීම මුළුමනින්ම ශුද්ධව තිබුණි. උන්වහන්සේ ශුද්ධාත්මයාණන් කරණකොට ගෙන පිළිසිඳ ගත් සේක. උන්වහන්සේ රහසින්වත් පව් නොකල සේක. එමෙන්ම කිසි පාපයක් උන්වහන්සේ තුල නොතිබුණි. **(1 යොහාන් 3:5)** සියයට සියයක් උන්වහන්සේට ශුද්ධවූ චරිතයක් තිබූ බැවින් පව්කාරයන් ගලවා ගැනීමට උන්වහන්සේට හැකි විය.

## 02 උන්වහන්සේ ප්‍රේමාන්විතයි. (එපීස 5:1-2)

**"ක්‍රිස්තුස්වහන්සේ නුඹලාට ප්‍රේමකොට, මිහිරි සුවඳක් පිණිස දෙවියන්වහන්සේට පූජාවක්ද යාගයක්ද කොට අප වෙනුවට තමන්ම පාවාදුන්නාක් මෙන්ම ......"**

ප්‍රේමණීය යේසුස්වහන්සේ පිළිබඳ මුළු බයිබලය පුරාවටම ඉතා මනාවට අපට පැහැදිලි කරයි. උන්වහන්සේගේ හදවත ප්‍රේමණීයයි. සුභාරංචි පොත් කියවන විට සමාජයේ විවිධ තරාතිරම් වල මනුෂ්‍යයෝ උන්වහන්සේ වෙත පැමිණ ආශිර්වාද ලැබූ ආකාරය ඔබට වැටහේවි.

## 03 උන්වහන්සේ ධර්මිෂ්ඨය (1 යොහාන් 3:7)

**"උන්වහන්සේ ධර්මිෂ්ඨව සිටින්නාක් මෙන් ධර්මිෂ්ඨකම් කරන්නා ධර්මිෂ්ඨව සිටී...."**

උන්වහන්සේ තම ධර්මිෂ්ඨකම සහිතව සිටින්නාසේම උන්වහන්සේගේ ක්‍රියා හා

විනිශ්චයද ධර්මිෂ්ඨය. උන්වහන්සේ තුල කිසි අධර්මිෂ්ඨකමක් කිසිවෙකුට සම්බ නොවීය.

## 04 උන්වහන්සේ අනුකම්පාවෙන් පූර්ණය. (එපීස 4:32)

**"නුඹලා එකිනෙකා කෙරෙහි ගුණවන්තව අනුකම්පා ඇතිව සිට, දෙවියන්වහන්සේ තුළ දෙවියන්වහන්සේ නුඹලාට කමාවුණ (අනුකම්පා කල) ලෙසම නුඹලාත් එකිනෙකාට කමා වෙයල්ලා".**

යේසුස්වහන්සේ හැමවිට මෘදු අනුකම්පාවෙන් යුක්ත වූ සේක. උන්වහන්සේ වෙත පැමිණි සියලු දෙනාට මෙන්ම ලෝකවාසී සියලුදෙනා කෙරෙහි අනුකම්පා සහිත හදවතින් සිටින සේක.

## 05 උන්වහන්සේ පවිත්‍රය. (1 යොහාන් 3:3)

**"උන්වහන්සේ කෙරෙහි මේ බලාපොරොත්තුව තබා සිටින සෑමදෙනාම උන්වහන්සේ පිරිසිදුව සිටින්නාක් මෙන් තමන්ම පිරිසිදු කර ගනිති".**

යේසුස්වහන්සේ පාපයක් නොදත්තාවූ තැනැත්තාය. උන්වහන්සේ පිරිසිදුය, පවිත්‍රය, එබැවින් පාපයෙන් අපවිත්‍ර වූ අය පවිත්‍ර කිරීමට උන්වහන්සේට හැකිය.

## 06 උන්වහන්සේ නිහතමානීය (පිලිප්පි 2:6-7)

**"උන්වහන්සේ දෙවියන්වහන්සේගේ රූපාකාරය දරන සේක්, දෙවියන්වහන්සේට සමානව සිටීම තමන් විසින් අල්ලාගෙනම සිටිය යුතු වූ වස්තුවක් යැයි නොසිතා එය ඉවත් කර, දාසයකුගේ ස්වරූපය ගෙන, මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිණිසේක".**

උන්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාය. සියලු තේජස, බලය, ගෞරවය, සහිතව සිටිය අතර, බොහෝ නිහතමානීව මනුෂ්‍යයන් අතර සේවය කල සේක.

## 07 උන්වහන්සේ යටහත් පහත්ය. (යොහාන් 13:3-5)

**"රාත්‍රීකෑම කද්දී, උන්වහන්සේ පියාණන් වහන්සේ විසින් තමන්ගේ අත්වලට සියල්ල දී තිබෙන බවද, තමන් දෙවියන්වහන්සේ වෙතින් ආ බවද, දෙවියන්වහන්සේ වෙතට යන බවද දැන... ඉන්පසු උන්වහන්සේ භාජනයට වතුර වත්කොට ගෝලයන්ගේ පාද සෝදන්ටත් තමන් ඉඟටියේ බැඳගත් රෙදි කඩකින් පිසදමන්ටත් පටන්ගත් සේක".**

තම ගෝලයන්ගේ පාද සේදීමට තරම්, සියලු බලය සහිත උන්වහන්සේ තමන්ම යටහත් පහත් කර ගත් සේක.

## 08 උන්වහන්සේ සමාව දෙන සේක. (කොලොස්සි 3:13)

**"එකිනෙකා ගැන ඉවසමින්, යමෙකුට විරුද්ධව යමෙකුගේ කාරණයක් ඇත්නම් එකිනෙකාට කමා වෙන්න; ස්වාමින්වහන්සේ නුඹලාට කමාවුනාක්මෙන්...."**

යේසුස්වහන්සේ අපගේ සියලු පාපවලට හා වරදට කමාව දෙන සේක. කිසිදිනක කිසිවකු වරදට පත් නොකරන සේක.

## 09 උන්වහන්සේ කීකරු වූ සේක. (පිලිප්පි 2:7-8)

**"උන්වහන්සේ මනුෂ්‍යාකාරයෙන් සිටිය කලත්, මරණය එසේය, කුරුසියේ මරණය දක්වා කීකරු වූ සේක".**

යේසුස්වහන්සේ හැම විටම පියාණන් වහන්සේට කීකරු වූ සේක. එමෙන්ම මනුෂ්‍යය සංහතියේ යහපත උදෙසා කුරුසියේ මරණය දක්වා දෙවියන්වහන්සේගේ කැමැත්තට කීකරු වූ සේක.

## 10 උන්වහන්සේ විඳ දරා ගත් සේක. (හෙබ්‍රෙව් 12:2-4)

**"උන්වහන්සේ වනාහි තමන් ඉදිරියෙහි තබා තිබුණු ප්‍රීතිය නිසා ලැජ්ජාව නොසලකා, කුරුසිය දරාගෙන, පසුව දෙවියන්වහන්සේගේ සිංහාසනයේ දකුණු පැත්තෙහි වැඩහිඳගත් සේක".**

ඉවසා විඳ දරා ගැනීම පිළිබඳ ලොව ශ්‍රේෂ්ඨතම උදාහරණය සියයට සියයක් මනුෂ්‍යයෙක් වූ යේසුස්වහන්සේය.

## 11 උන්වහන්සේ කරුණාවන්තය. (ලූක් 6:35)

**"කෘතෝපකාර නොසලකන්නන්ටද දුෂ්ටය න්ටද උන්වහන්සේ කරුණාවන්තව සිටින සේක".**

සැබෑ කරුණාව තම ජීවිතය සොයන්නාවූ අයට යේසුස්වහන්සේ කරුණාවේ උල්පතය.


## 12 උන්වහන්සේ ත්‍යාගශීලීය. (2 කොරින්ති 8:9)

**"මක්නිසාද අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාව එනම්, උන්වහන්සේ ධනවත්ව සිටිය නමුත්, උන්වහන්සේගේ දිළිඳුකම කරණකොට ගෙන නුඹලා ධනවන්ත වන පිණිස, නුඹලා උදෙසා දිළිඳුවූ බව නුඹලා දන්නහුය".**

මේ ලෝකයේ පමණක් නොව සදාකාලිකව අප ධනවත් කරන පිණිස, තම ජීවිතය දෙන තරම් උන්වහන්සේ ත්‍යාගශීලීව ක්‍රියා කල සේක.

ඉහත චරිත ලක්‍ෂණ පමණක්ම, සීමා කල නොහැකි අසීමිත ගුණාංග වලින් හෙබි යේසුස්වහන්සේ අනුගමනය කිරීම තරම් වාසනාවක් මිහිපිට මිනිසකුට නැත. උන්වහන්සේ සෑම මනුෂ්‍යයකුගේම පරම ආදර්ශයයි. අපිත් අපගේ චරිතය, ජීවිතය, මේ මහා උත්තරීතර ගැලවුම්කරුවාගේ ජීවිත ආදර්ශය අනුව හැඩගස්වා ගෙන මේ ලෝකයට ආදර්ශයක් සපයමු. එසේ කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේගේ නිරන්තර පිහි ට උපකාරය ලැබේවා !

සංස්කාරක
**එස් මෙත්තානන්ද**
**077 8813197**



# යුද්ධය

පෙර රජවරු යුද්ධකර ජය ලබා මහත් කොල්ලයන් ලැබූ බවට බොහෝ උදාහරණ ශුද්ධ බයිබලයේ පරණ ගිවිසුමෙහි සඳහන් වේ. ඒ අතරින් යෙහෝෂාපාට් රජතුමා යාච්ඤාවේ බලයෙන් කළ ජයග්‍රහණය සහ ඔහු ලැබූ කොල්ලය ගැන දේව වචනයෙහි මෙලෙස සඳහන් වේ. **"යෙහෝෂාපාට්ද ඔහුගේ සෙනගද ඔවුන්ගෙන් කොල්ලය ගන්ට ආ කල වස්තුවද, අනර්ඝ බඩුද, ඔවුන්ට සම්බවුණෝය; ගෙන යන්නට බැරි තරම් ඔවුන් ඒවා ගලවා ගත්තෝය, කොල්ලය අධික බැවින් ඔවුන් තුන් දවසක් ඒවා එකතු කරමින් සිටියෝය" (2 ලේකම් 20:25).** ප්‍රිය සහෝදර සහෝදරියනි, යුද්ධයකින් ජය ගන්නාට කොල්ලයත්, ප්‍රීතියත් ලැබෙන අතර පරාජය වන්නාට තම ජීවිතය අහිමි වේ. නුමුත් ජය ගන්නාට හෝ පරාජය වන්නාට "යුද්ධය" යනු කිසිලෙසකින්වත් පහසු දෙයක් නොවේ.

ජීවත් වීමද යුද්ධයක් ලෙස අර්ථ දක්වන ලෝකයක අවදි වූ වේලාවේ සිට නින්දට යන තුරු යන්ත්‍ර මෙන් වැඩ කරන්නට පුරුදුව සිටින ඇදහිලිවන්ත අපි ජීවිතයේ සැබවින්ම අප ඉදිරියෙහි තිබෙන යුද්ධය ගැන සිතනවාද? ඒ පැය 24 ක දවසක් තුල අනෙක් අය උදෙසා අපේ වැඩ කොටස, වගකීම, යුතුකම නොපිරිහෙලා ඉටු කිරීමද? අපගේ පියවූ දෙවියන්වහන්සේ ඉදිරියෙහි ගත කිරීමට කාලය සොයා ගැනීමද? සැබවින්ම අපේ යුද්ධය දෙවැනි ප්‍රශ්ණය නොවේද? ශුද්ධ බයිබලයේ **ගීතාවලිය 119:162** වන පදයෙහි මෙසේ පවසයි **"මහත් කොල්ලයක් ලබන කෙනෙකු මෙන් මම ඔබගේ වචනයෙහි ප්‍රීති වෙමි."** මෙම දේව වචන කොටසට අනුව අප ලබන කොල්ලය නම් "දේව වචනයයි" මේ මහත් ප්‍රීතිය ලැබීමට අපගේ යුද්ධය වන්නේ දේව වචනය දැන ගැනීමට බයිබලය අධ්‍යයනය කිරීමයි. කිතුණු ඇදහිලිවන්තයන් බොහෝ දෙනෙක් ඉරු දිනට පමණක් බයිබලය පෙරලා කියවති. සමහරුන් පුරුද්දට බයිබලයෙන් පද පේළි කිහිපයක් කියවා යාච්ඤාවක් කරති. මේ අතර තවත් ඇදහිලිවන්ත පිරිසක් තමන් කිතුණුවන් නිසා බයිබලයක් නිවසේ තබා ගනිති. ඔබ අයත් වන්නේ ඉහත පිරිසෙන් කුමන කණ්ඩායමටද? නුමුත් සැබවින්ම ඔබ මේ එකදු කණ්ඩායමකටවත් අයත් නොවන්නේ නම්, දැනටමත් ඔබ දිනපතා බයිබලය කියවීම, අධ්‍යයනය කිරීම තුලින් දෙවියන්වහන්සේගේ හදවතට ළංවීමට තිබෙන බාධක ජය ගැනීමට රණ බිමට අවතීර්ණව සිටී. මෙලෙස අපව රණ බිමට තල්ලු කරන සාධක 3 ක් වේ.

## 01 මාංසය සහ ස්වභාවික සිත.

අපේ මාංසය සහ සිත කවදත් තමා පිනවා ගැනීමෙහි කැමතිය. දේව වචනය අධ්‍යයනය කිරීමෙන් අපව වලක්වන කම්මැලිකම, නිදිමත, විවිධ කල්පනා, සිතුවිලි, කතා කරමින් සිටීමට ඇති කැමැත්ත මාංසයෙන් හා සිතෙන් වේ. මංසය සහ සිත පිළිබඳ බොහෝ සත්‍යතාවයන් දේව වචනයෙහි සඳහන්ව තිබෙන අතර ඒ අතරින්;

**"මක්නිසාද මාංසික ලෙස සිටින්නෝ මාංසික දේවලටද, ආත්මික ලෙස සිටින්නෝ ආත්මික දේවලටද ඇලුම් වෙති. මාංසයේ ඇල්ම මරණයය; නුමුත් ආත්මයේ ඇල්ම ජීවනය හා සමාදානයය" (රෝම 8:5-6).**

**"නුමුත් තෘෂ්ණා පූර්ණ කරන පිණිස මාංසයට ඉඩනොදී, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පැළඳගනිල්ලා" (රෝම 13:14).**

**"සියල්ලට වඩා සිත රැවටිලිකාරව තිබේ, ඒක දුෂ්ටව තිබේ. ඒක කාට දැනගන්ට පුළුවන්ද?" (යෙරමියා 17:9)** යන දේව වචන කොටස් දැන ගැනීම වටී. මාංසය සහ සිතට එරෙහි යුද්ධය ඔබ ඔබටම විරුද්ධව කරන යුද්ධයක් වැනිය.

## 02. ලෝකය

ලෝකය යනු අපව දේව වචනය සමඟ කාලය ගත කිරීමෙන් ඉවත් කරන ආකර්ෂණීය සතුරෙකි. දේව වචනයෙහි සඳහන් පරම සත්‍යතාවයන් කෙරෙහි සැක මතු කරමින් අපව මුලා කිරීමට ලෝකය දක්ෂය. දේව වචනය පරිශීලනය කිරීමට වඩා රූපවාහනිය නැරඹීම, ප්‍රවෘත්ති කියවීම, කාලීන සිදුවීම්, රසාස්වාදන, විවිධ සොයා ගැනීම්, මතිමතාන්තර අතර දෝලනය වීමට හා ඒවාට ඇලී සිටීමට ලෝකය අපට ආරාධනා කරයි. ලෝකය බොහෝ දේ අපට පිළිගන්වන්නේ අලංකාරවය.

**"ලෝකය සමඟ මිත්‍රකම දෙවියන්වහන්සේට සතුරුකම බව නුඹලා දන්නේ නැද්ද? එබැවින් කවරෙක් නමුත් ලෝකයට මිත්‍ර වෙන්ට කැමැත්තේ නම්, ඔහු දෙවියන්වහන්සේට සතුරෙක් වන්නේය" (යාකොබ් 4:4).**

**"ලෝකයටවත් ලෝකයෙහි තිබෙන දේවලටවත් ප්‍රේම නොකරල්ලා. යමෙක් ලෝකයට ප්‍රේම කෙරේ නම් පියාණන්වහන්සේ කෙරෙහි ප්‍රේමය ඔහු තුල නැත. මක්නිසාද ලෝකයේ තිබෙන සියල්ල එනම්, මාංසයේ තෘෂ්ණාවන්, ඇස්වල තෘෂ්ණාවන් ජීවිතයේ අහංකාර කමත් පියාණන්ගෙන් නොව ලෝකයෙන් වේ" (1 යොහාන් 2:15-16).** දෙවියන්වහන්සේ සමඟ එකඟත්වයකට පැමිණීමට ලෝකය නම් සතුරා ඔබ පැරදවිය යුතුය.

## 03 සාතන්

ඔබට හමුවන උපායශීලි හා භයානකම සතුරා සාතන් හෙවත් යක්ෂයාය. ඔබ දේව වචනය අධ්‍යයනය කිරීම හා මෙනෙහි කිරීම වැලැක්වීමට ඕනෑම දෙයක් කිරීමට සූදානමින් සිටී. ඔබ දේව වචනය අධ්‍යයනය කිරීම නැමති යුද්ධයෙන් ජය නොගැනීම සඳහා සෑම විටම ඔබව වෙනතකට යොමු කිරීමට ක්‍රියා කරයි. ඔබ ඉදිරියේ බොහෝ ප්‍රශ්ණ, කරදර හා ගැටළු තබමින් ඔබ හා දේව වචනය අතර සබඳතාවය අත්හැරීමට ඔබව පෙළඹවීමට තරම් රැවටිලිකාරයෙකි. ඔබ, යාච්ඤාව හා දේව වචනය අතර පවතින සබඳතාව අඩුවන හා නැතිවී යන තරමට යක්ෂයා මහත් කොල්ලයක් ලැබූ එකෙකු මෙන් සන්තෝෂවන බව ඔබ දන්නවාද? ඔබට රණ බිමේදී සාතන්ව පැරදවිය හැක්කේ දේව වචනය තුලින්ම පමණී. ඒ සඳහා ආදර්ශය අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අප ඉදිරියෙහි තැබූ සේක. යක්ෂයා විසින් උන්වහන්සේව පරීක්ෂා කරනු ලැබූ අවස්ථාවේ උන්වහන්සේ දේව වචනය තුලින් ජය ලැබූ සේක. **(මතෙව් 4:1-11, ලූක් 4:1-13)** උන්වහන්සේගේ අනුගාමිකයන් වන අපටද යක්ෂයාගෙන් ජයගත හැක්කේ දේව වචනය තුලින් පමණි.

ප්‍රිය සහෝදර සහෝදරියනි, දේව වචනය ඉගෙනීම නම් උන්වහන්සේ වාගේ වීමට උත්සහ කිරීමයි. දේව වචනය තුලින් උන්වහන්සේගේ හදවත කියවීමයි. ඔබ දේව වචනය අධ්‍යයනය කල යුත්තේ වචනය දැන ගැනීමට වඩා වචනයේ දෙවියන්වහන්සේව දැන ගැනීම සඳහාය. ඔබ ගත කරන්නේ ලෞකික ජීවිතයක් යැයි ඔබේ හදවතට හැඟෙනවා නම් එයට මූලික හා එකම හේතුව ඔබ දේව වචනය පරිශීලනය නොකිරීමයි. අපි මේ යුද්ධයෙන් ජය ගත්තොත් අපට ප්‍රීතිය ලැබෙන අතර පරාජය වුනොත් අපව කොල්ලයක් බවට පත්වී ආත්මිකව දුර්වල වී ලෞකික භාවයට පත් වී ආත්මික පරිහානියකට පත් වෙයි. මේ සතුරන් පරාජය කර දෙවියන්වහන්සේ සමඟ කාලය ගත කර ඒ තුලින් මහත් කොල්ලයක් ලබා ගැනීමට දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම හා අනුග්‍රහය බහුලව ඔබ සමඟ වේවා!

**- බයිබල් අධ්‍යයනයක් ඇසුරිනි -**

# මාර්ටින් ලූතර්



"මොකක්ද ශුද්ධ ගිනි ස්ථානය කියන්නේ" ඔහු පියාගෙන් ඇසුවේය. "අපි මැරුණම යන තැන" පියාගේ පිළිතුර විය. "අපි ස්වර්ගයට යනකම් එතන තමයි ඉන්නේ" ඔහු තවදුරටත් විස්තර කළේය. "ඒත් මට ඕන මැරුණට පස්සේ කෙලින්ම ස්වර්ගයට යන්න" "ඔයාට ඒක කරන්න බැහැ පුතේ, මොකද ඔයා දැනටමත් හුඟක් නරක දේවල් කරලා තියෙනවානේ (පාප්තුමා, අගරදගුරු, කාදිනල්වරු වගේ අය තමයි කෙලින්ම ස්වර්ගයට යනවා කියලා මම හිතන්නේ)" "එතකොට බිෂොප්වරු, සහ පූජකයන්?" " ශුද්ධ ගිනි ස්ථානයට" "එතකොට කොහොමද ශුද්ධ ගිනි ස්ථානයෙන් එළියට එන්නේ" එතනින් එළියට එන්නනම් අපි ඇති පමණ යාච්ඤාවන් කියන්න ඕනා. දාන සහ මුදල් සභාවට පරිත්‍යාග කරන්න ඕනා.

ලූතර් මහතා සහ ඔහුගේ පුත් මාර්ටින් අතර වූ සාකච්ඡාවෙන් පසු කුඩා මාර්ටින්ගේ සිත බොහෝ කනස්සල්ලට පත් විය. " මාගේ නරක වැඩ නිසා මට ස්වර්ගයට යන්න බැරිද" ඔහුගේ සිතේ මේ ප්‍රශ්ණය නිදන්ගත විය. පිරිමි දරුවන් තිදෙනෙකුගෙන් යුතු ලූතර් පවුලේ දෙවැනියා මාර්ටින්ය. මව සහ පියා සමඟ ඔහු ජීවත් විය. පාසල් අධ්‍යාපනයෙන් පසු විශ්ව විද්‍යාලයට ඇතුලත් වූ මාර්ටින් නීතිඥයකු වීමේ අරමුණින් නීතිය හැදෑරුවේය. නීති ශිෂ්‍යයකුව අධ්‍යපානය ලැබූ ඔහුගේ සියලු සැලසුම් එක් නිමේෂයකින් වෙනස්විය. දරුණු කුණාටුවක් එකවිටම ඔහුගේ හිසට ඉහලින් විය. එහි ආලෝකයෙන් ඔහුගේ ඇස් නිලන්කාරව ගියේය. "ශාන්ත ආනා මවුනි මට උපකාර කළ මැනව". ඔහු කෑගැසුවේය. "මම පූජකයෙක් වෙන්නම්" ඔහු භාරයක්ද විය. පසුව පියාගේ වැඩි මනාපයකින් තොරව ඔහු කතෝලික පූජකයෙක් විය. නමුත් කුඩා කල සිට ඔහුගේ හදවතෙහි නිදන්ව තිබෙන ප්‍රශ්ණයට තරුණ පූජක මාර්ටින් පිළිතුරු සොයන්නට විය. " ස්වර්ගයට යෑමට සුදුසුකම් ලැබීමට මම හොඳ කෙනෙක් වෙන්නේ කොහොමද" ඒ සඳහා බොහෝ ක්‍රියාවන් ඔහු විසින් අනුගමනය කළේය. සෑම උදෑසනකම ස්වාමීන්ගේ යැච්ඤාව 50 වතාවක් කීම, සෑම දිනකම ඉතා කුඩා ආහාර ප්‍රමාණයක් ගැනීම, පරණ ඇඳුම් ඇදීම, සෑම දිනකම අලුයම 2 සිට ඉරු උදාව දක්වා යාච්ඤා කිරීම හා යේසුස්වහන්සේගේ මේ ලෝකයේ ජීවිතය හා සම්බන්ධ සිද්ධස්ථාන වැඳපුදා ගැනීම. නමුත් මේ කිසිම ක්‍රියාවක් හෝ පිළිවෙතක් ඔහුගේ ප්‍රශ්ණයට පිළිතුරු නොවීය.

කාලය ගත වන අතරේ එක් දේව වචන

කොටසක් ඔහුගේ හදවතට කා වැදුනේය. ඔහු දණ නමා ඔහුගේ බයිබලය ගෙන පදයෙන් පදය දේව වචනය අධ්‍යයනය කරන්නට විය. මෙතෙක් කල් ඔහුගේ හදවතෙහි ඔහු කැළඹීමට පත් කළ ප්‍රශ්ණයට විසඳුම ඔහු ලැබුවේය. විශ්වාසවන්ත පූජකයෙක් වූ මාර්ටින් ලූතර් ඔහු දැනගත් මේ පරම සත්‍යය පිළිබඳ දෙවියන්වහන්සේට ස්තූති කළේය. "දේව වචනයෙහි ශුද්ධ ගිනි ස්ථානයක් ගැන හෝ කිසිඳු වත් පිළිවෙත් ක්‍රම ගැන සඳහනක් නැත" යන මේ පරම සත්‍යය. ඔහු මිත්‍යා විශ්වාසයන්ගෙන් නිදහස් විය. ක්‍රිස්තුවර්ෂ 1517 දී කතෝලික සභාව මගින් හා පාප්තුමා විසින් නිවේදනය කරන ලද එක්තරා නිවේදනයක් වූ "අනුෂේධ පත්‍ර විකිණීම" නිසා ඔහු කතෝලික ඇදහිලි වලින් සම්පූර්ණයෙන් ගැලවී පිටතට පැමිණියේය "නුඹේ පව් කමා කරන ලදී" යයි ලියන ලද තුන්ඩු කැබැල්ලක් නිසා දෙවියන්වහන්සේ අපව ස්වර්ගයට පිළිග නීද? මෙය මාර්ටින් ලූතර් ගේ තර්කය විය. තව දුරටත් පල්ලිය මගින් උගන්වන නිසා හෝ මුදල් පරිත්‍යාගයන් නිසා ස්වර්ග යට යෑමට හැකියි යන්න මනුෂ්‍යයන් විශ්වාස කරනවාට අකමැති වූ ඔහු දීර්ඝව දේව වචනය අධ්‍යනය කර "පල්ලියෙන් උගන්වනු ලබන එහෙත් දේව වචනයෙහි අඩංගු නොවන අසත්‍යයන් 95ක්" යනුවෙන් ලැයිස්තුවක් සකස් කර එය ඔහුගේ පල්ලියේ ප්‍රධාන පිවිසුම් දොරෙහි ඇලෙව්වේය. මෙය බොහෝ ඇදහිලිවන්තයන් කියවූ අතර, ලූතර්ගේ මෙම ක්‍රියාව ප්‍රදේශයේ ප්‍රසිද්ධ විය. මනුෂ්‍යයන් අතර විවිධ මති මතාන්තර ගොඩ නැගුණු නමුත් කිහිපදෙනෙක් මාර්ටින් ලූතර් සමඟ එකඟ විය. ඔහුගේ මෙම ක්‍රියාව රෝමයේ සිටි පාප්තුමාට සැලවූ අතර ඔහුව රෝමයට කැඳවීමට අණ ලැබුණි. බොහෝ ඇදහිලිවන්තයන් දෙවියන්වහන්සේගේ නියෝගයන්ට වඩා පාප් තුමාගේ නියෝග යන්ට බයව ඉස්මුදුනින් ඒවා පිළිගත්තත් මාර්ටින් ඔහුගේ නියෝගය ප්‍රතික්ෂේප කළේ "පාප්" ලෙස හඳුන්වන කිසිදු චරිතයක් දේව වචනයේ සදහන් නොවන බව පෙන්වා දෙමිනි. ඔහුගේ මේ ක්‍රියාව බොහෝදෙනාගේ විස්මයට හේතු විය.

පසුව මාර්ටින් ලූතර්ගේ ඉගැන්වීම් ප්‍රසිද්ධියට පත් වූ අතර බොහෝ ඇදහිලිවන්තයන් ඔහු වටා එක් රැස් විය. ඔහුගේ සමහර ඉගැන්වීම් ඔහුට වඩා අවුරුදු 150 කට පමණ පෙර ජීවත් වූ ඉංග්‍රීසි ජාතික John Wycliffe ගේ ඉගැන්වීම් වල ආභාශය ලබා තිබූ අතර මාර්ටින් ලූතර් ට වඩා ශත වර්ෂයකට පමණ පසු ජීවත් වූ Jan Hus ගේ ඉගැන්වීම් ඒවාට සම විය. Wycliffe හා Hus ගේ අනුගාමිකයන් මාර්ටින් ලූතර් ධෛර්යයට පත් කරනු ලැබූ අතර දේව වචනයේ සත්‍යතාවයන් උදෙසා ඔවුන් ශක්තිමත්ව නැගී සිටියේය. මාර්ටින් ලූතර්ගේ ඉගැන්වීම් සමඟ එකඟ වූ මේ අනුගාමිකයන් බොහෝ දෙනෙක්ද 1520 දෙසැම්බර් 10 වන දින දේව වචනයේ අඩංගු සත්‍යතාවයන් ගැන ලියැවුණු බොහෝ පොත් පත් සමඟ ප්‍රසිද්ධියේ ගිනි තැබුවේ කතෝලික සභාව විසින් එම සත්‍යයන් පිළිනොගත් බැවිනි. නමුත් පල්ලිය, පූජකයන් හෝ තවකෙක් කියන දේ අසා සිටීමට වඩා බයිබලය කියවා එහි සඳහන් සත්‍යතාවයන් තේරුම්ගැනීමේ වෙනස තේරුම්ගැනීමට ඇදහිලිවන්තයන් පෙළඹවීමට මාර්ටින් ලූතර්ට හැකි විය. මරණින් මතු ස්ථිර බලාපොරොත්තුව ගැන හා පව්කමාව ලැබෙන්නේ ක්‍රියා නිසා නොව ඇදහිල්ලෙන් යන සත්‍ය බොහෝදෙනා පිළිගත්හ.

**- පරිවර්තනයකි -**

**IREN HOWAT ගේ (Ten boys who made a Difference) කෘතිය ඇසුරිණි.**

# ශ්‍රේෂ්ඨ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන් උන්වහන්සේගේ දරුවන්ට ලැබෙන ශ්‍රේෂ්ඨ උතුම් වූ සම්පත්

## 01 ශ්‍රේෂ්ඨ නොහොත් උතුම් ගැලවීම. - (පිලිප්පි 3:8)

**"මගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හඳුනාගැනීමේ උතුම්කම නිසා සියල්ල අලාභයයි සලකමි".**

මේ විශ්වයේ ශ්‍රේෂ්ඨම පුද්ගලයා නොහොත් ප්‍රේමවන්තයා වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දැන හඳුනා ගැනීම තරම් උතුම්කමක් තවත් නැත. එමෙන්ම උන්වහන්සේ දෙන ශ්‍රේෂ්ඨ ගැලවීම අත්පත් කර ගැනීම සදාකාලික වූ උතුම්ම සම්පතයි. ගැලවීමේ ශ්‍රේෂ්ඨත්වය දැනගෙන නිම කල නොහැක.

## 02 ශ්‍රේෂ්ඨ නොහොත් උතුම් වූ ගිවිසුම - (හෙබ්‍රෙව් 7:22)

**"යේසුස්වහන්සේ වඩා උතුම් වූ ගිවිසුමක ඇපකාරයා වී සිටින සේක".**

යේසුස්වහන්සේ විසින් මනුෂ්‍යය සංහතිය උදෙසා නව ගිවිසුමක් ඇති කල සේක. එනම් තම මරණය කරණකොට ගෙන, තම ශරීරය හා ලේ වලින් එම ගිවිසුම ස්ථාපිත කලසේක. එනම් පව්කාරයන් උදෙසා මරණය විඳීමෙන් එම පව්කාරයන්ගේ පව්කමා කිරීමයි. යේසුස්වහන්සේ කෙරෙහි අදහන, විශ්වාස කරන අයගේ පව්කමා කිරීමත් ඔවුන් ධර්මිෂ්ඨ කොට ගණන් ගැනීමත්, සදාකාල ජීවනය ප්‍රදානය කිරීමත්ය. **"පාපයේ කුලිය නම් මරණය, නමුත් දෙවියන්වහන්සේගේ දීමනාව නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සදාකාල ජීවනය" (රෝම 6:23).**

## 03 ශ්‍රේෂ්ඨ නොහොත් උතුම් දෙවියන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේ - (1 යොහාන් 4:4)

**"මාගේ ප්‍රිය දරුවෙනි, නුඹලා දෙවියන්වහන්සේට අයිතිව, ලෝකයේ සිටින තැනැත්තාට වඩා නුඹලා තුළ සිටින තැනැන්වහන්සේ උතුම් බැවින්, නුඹලා ඔවුන්ගෙන් ජයගෙන සිටින්නෝය".**

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ස්වාමින් වහන්සේ හා ගැලවුම්කරුවා ලෙස හඳුනන, අයට ශුද්ධාත්මයාණන්වහන්සේ යන උතුම් සම්පත සහිතයි. අප සමග නැවතී සිටීමට එනම් අප තුලට උන්වහන්සේ වැඩ සිටින අතර නිතර යේසුස්වහන්සේගේ දේ රැගෙන අපට ප්‍රකාශ කරයි, මගපෙන්වයි. මේ ආකාර මහත් උතුම් සේවයක් ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුල ඉටු කරයි.

## 04 ශ්‍රේෂ්ඨ නොහොත් උතුම් පොරොන්දු - (2 පේත්‍රුස් 1:4)

**"උන්වහන්සේ තමන් අනර්ඝ ඉතා උතුම් පොරොන්දු අපට දී තබේ; එසේ කලේ තෘෂ්ණාව නිසා ලෝකයේ තිබෙන දූෂ්‍යයකමෙන් නුඹලා ගැළවී, ඒ පොරොන්දු කරණකොට ගෙන දේව ස්වභාවයට**

**පංගුකාරයන් වන පිණිසය".**

මුළු බයිබලය දෙවියන්වහන්සේගේ දරුවන් වෙත වදාළ උතුම් පොරොන්දු වලින් පිරී තිබේ. එහි වචන පමණක් නොව අපගේ ඇදහිල්ලේ ප්‍රමාණයට ක්‍රියා කරන බලයද අඩංගුය. පොරොන්දු අල්ලා ගන්නා අයගේ ජීවිත තුල එම පොරොන්දු දෙවියන්වහන්සේ විසින්ම ඉටු කරන සේක. ඔබත් දෙවියන්වහන්සේගේ පොරොන්දු අල්ලා ගන්නෙක්ද?

## 05 ශ්‍රේෂ්ඨ නොහොත් උතුම් රට (ස්වර්ගය) - (හෙබ්‍රෙව් 11:16)



**"ඔව්හු දැන් වඩා උතුම්වූ, එනම් ස්වර්ගීයවූ රටකට ආශා ඇත්තෝය. එබැවින් දෙවියන්වහන්සේ ඔවුන්ගේ දෙවියන්වහන්සේයයි කියනු ලබන්ට ලැජ්ජා නොවනසේක. මක්නිසාද උන්වහන්සේ ඔවුන්ට නුවරක් සූදානම් කළ සේක".**

ස්වර්ගය, දෙවියන්වහන්සේගේ රාජ්‍යය, දිව්‍ය ලෝකය, මතු පැමිණෙන නුවර, විවිධ නම් වලින් ලෝකය පුරාවට විවිධාකාරයෙන් අර්ථ දක්වන එකම ස්ථානය වන ඒ උතුම් රට පිළිබඳව ඔබ හරියාකාරව දැනුවත්ද? ඒ උතුම් රටට යාමට හැකි වන්නේ යේසුස්වහන්සේගේ දරුවන්ට පමණක් බවද අප දැනගත යුතු පරම සත්‍යයක් බවත් දිනක ඒ උතුම් රටට යන බවට සහතිකයක් තිබේද?.

## 06. ශ්‍රේෂ්ඨ නොහොත් උතුම් දීමනා - (1 කොරින්ති 12:31)

**"වඩා උතුම් දීමනාවලට ආශාවෙයල්ලා".**

දෙවියන්වහන්සේ අදහන, උන්වහන්සේගේ මාර්ගයේ යන, බය පක්ෂපාතී මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ වඩා උතුම් දීමනා වලින් සරසන සේක. එසේ කරන්නේ සභාවේ වර්ධනය පිණිස හා එකිනෙකාගේ ප්‍රයෝජනය පිණිස වඩා උතුම් දීමනා අප දේව වචනයෙන් සොයා දැනගමු.

## 07 ශ්‍රේෂ්ඨ නොහොත් උතුම් ක්‍රියා - (1 තිමෝති 6:18-19)

**"උතුම් ක්‍රියා වලින් ධනවත් වෙන්ටත්, .................. ආඥා කරපන්න".**

දෙවියන්වහන්සේගේ ආඥාව නම් උන්වහන්සේගේ වචනයේ ලියා තිබෙන උතුම් ක්‍රියා අපගේ හදවතේ දරාගැනීමත් එම ක්‍රියාවන් ප්‍රායෝගිකව දිනපතා අපගේ ජීවත් වන පරිසරය තුල ඉටුකිරීමත්ය. ඒ උතුම් ක්‍රියා මොනවාදැයි සොයා දැනගනිමු.

**- ගුරුහරු -**

# ශ්‍රේෂ්ඨ යේසුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨ පොරොන්දු

ස්වාමී වූ යේසුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ අප සිතා බැලීමේදී ඒ පිළිබඳ අධ්‍යයනය කර නිම කිරීමට නොහැකිය. සදාකාලයද මදිවන තරමට සෙව්වත් උන්වහන්සේගේ උත්තරීතර භාවය දැනගැනීමට අපට නොහැක. ශුද්ධ බයිබලය පුරාවට එළිදරව් කරන යේසුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨ පොරොන්දු අපට දක්නට ලැබේ. උන්වහන්සේ අදහා ගන්නාවූ හා අනුගමනය කරන්නාවූ අපට එම පොරොන්දු වලට හිමිකම් කිව හැකිය. අපගේ ජීවිතයේ විවිධ අවස්ථාවලදී හා ජීවිතය පුරාවට විශ්වාස කළ හැකි මෙම පොරොන්දු අපට දී තිබෙන්නේ අප දේව ස්වභාවයට පංගුකාරයන් වන පිණිසය.



### ▫ පොරොන්දු වල අභිප්‍රාය.

උන්වහන්සේ තමන් අනර්ඝ ඉතා උතුම් වූ පොරොන්දු අපට දී තිබෙන සේක. එසේ කළේ තෘෂ්ණාව නිසා ලෝකයේ තිබෙන දූෂ්‍යකමෙන් නුඹලා ගැළවී ඒ පොරොන්දු කරණකොටගෙන දේව ස්වභාවයට පංගුකාරයන් වන පිණිසය. - **(2 පේත්‍රුස් 1:4).**

එමෙන්ම දේව වචනයේ අඩංගු පොරොන්දු පුද්ගලිකව දෙවියන්වහන්සේ වෙතින් ලබා ගැනීමට අපට හැකිය. බයිබලය කියවීම තුලින් දෙවියන්වහන්සේගේ හඬ ඇසීමට හැකිය. උන්වහන්සේ වචනය තුලින් අපට කතා කරන සේක. එසේ ලබාගන්නා පොරොන්දු අපගේ ජීවිතයේ ඉටු කිරීම ට දෙවියන්වහන්සේට හැකි බව විශ්වාස කිරීම අපගේ ඇදහිල්ලයි.

**අපගේ බලාපොරොත්තුවේ ප්‍රකාශ කිරීම චංචල නොවන පිණිස එය තදින් අල්ලාගෙන සිටිමු. මක්නිසාද පොරොන්දු දුන් තැනැන්වහන්සේ විශ්වාසව සිටින සේක (හෙබ්‍රෙව් 10:23).**

### ▫ පොරොන්දු වල බලය.

**දෙවියන්වහන්සේගේ පොරොන්දු දෙස බලා ඇදහිල්ලෙන් බලවත්ව දෙවියන්වහන්සේට ගෞරව කරමින් පොරොන්දු වූ දේ ඉෂ්ට කරන්ට උන්වහන්සේට පුළුවන් කියා නිසැකවම විශ්වාස කළේය (රෝම 4:20-21).**

දේව දරුවන් වන අප දෙවියන්වහන්සේගේ පොරොන්දු අල්ලා ගත යුතුය. උන්වහන්සේ අප එකිනෙකාට පුද්ගලිකව පොරොන්දු දෙන බවත් ඒවා ඉෂ්ට කරන්නට උන්වහන්සේට පුළුවන් බවත් අප විශ්වාස කරන විට දෙවියන්වහන්සේ එම පොරොන්දු ඉටු කරයි.

## □ පොරොන්දු අප පවිත්‍රව තබයි.

**ප්‍රේමවන්තයෙනි, මේ පොරොන්දු අපට තිබෙන නිසා, මාංසයේද, ආත්මයේද, සියලු කිලිටුකම් වලින් අපම පවිත්‍ර කර ගනිමින්, දෙවියන්වහන්සේ කෙරෙහි භයින් යුතුව, ශුද්ධකම සම්පූර්ණ කර ගනිමු (2 කොරින්ති 7:1).**

දෙවියන්වහන්සේගේ පොරොන්දු දෙස බලාපොරොත්තුවෙන් ජීවත් වන ඇදහිලිවන්තයා ලෝකයේ තිබෙන පාපයෙන් අපවිත්‍ර වන්නේ නැත. තමාම වෙන්ව සිටිමින් පවිත්‍ර ශුද්ධ ජීවිතයක් යේසුස්වහන්සේ උදෙසා ගත කරයි. මෙය මහත් අසීරු කාරණයක් ලෙස පෙනුනත් එය නිවැරදි මාර්ගයයි.

## □ පොරොන්දු ඇදහිල්ල වර්ධනය කරයි.

**අපේ බලාපොරොත්තුවේ ප්‍රකාශවීම චංචල නොවන පිණිස එය තදින් අල්ලාගෙන සිටිමු; මක්නිසාද පොරොන්දුව දුන් තැනැන්වහන්සේ විශ්වාසව සිටින සේක (හෙබ්‍රෙව් 10:23).**

දෙවියන්වහන්සේගේ පොරොන්දු අල්ලාගන්නා දේව දරුවා දිනෙන් දිනම ඇදහිල්ලෙන් ශක්තිමත් වන අතර ඔහු දෙවියන්වහන්සේට වඩ වඩා ළංව ජීවත් වෙයි. ඔහුගේ යාච්ඤාවට උන්වහන්සේ උත්තර දෙන අතර ඔහුගේ ජීවිතය දෙවියන්වහන්සේට වඩා ප්‍රයෝජනවත්ද වේ. බයිබලයේ පුරාවට තිබෙන දේව දරුවාට අල්ලාගත හැකි පොරොන්දු විශ්වාස කිරීම මගින් අපගේ චරිතය ඔප මට්ටම් වන අතර ජීවිත සාක්ෂිය කැපී පෙනෙයි. දිනපතා ජීවිතයේදී අපට තදින් අල්ලාගත හැකි පොරොන්දු කිහිපයක් පහත සඳහන් වේ.

**01. වෙහෙස වෙන්නාවූ බර උසුලන්නාවූ සියල්ලෙනි මා වෙතට වරෙල්ලා, මම නුඹලාට සහනය දෙමි (මතෙව් 11:28).**

**02. ඉල්ලාපල්ලා නුඹලාට දෙනුලැබේ (මතෙව් 7:7).**

**03. මම මාගේ සභාව ගොඩනගමි (මතෙව් 16:18).**

**04. මක්නිසාද දෙදෙනෙකුගේ හෝ තුන්දෙනෙකු මාගේ නාමයෙන් යම් තැනක රැස්ව සිටී නම් මම එතැන ඔවුන් මැද සිටිමි කී සේක (මතෙව් 18:20).**

**05. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටිමි (මතෙව් 28:20)**

**06. මම කිසිසේත් නුඹෙන් අහක්ව නොයමි. කිසි අන්දමකින්වත් නුඹ අත් නොහරිමි. (හෙබ්‍රෙව් 13:5)**

**- ජීවන හඬ -**

# ආලෝකය



**"නුඹලා ලෝකයේ ආලෝකයය. කන්දක් මුදුනෙහි තිබෙන නුවරක් සඟවන්නට නොහැකිය. මනුෂ්‍යයෝ පහනක් දල්වා කුරුණිය යට නොව පහන් රුක උඩ තබති; එවිට එයින් ගෙයි සිටින සියල්ලන් කෙරෙහි ආලෝකය බබළයි. එසේම මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියෙහි බබළාවා" (මතෙව් 5:14-16)**

ඉහත දේව වචන කොටසෙහි විග්‍රහ කරන "ආලෝකය" කිතුණු ඇදහිලිවන්තයන්ට පමණක්ම ආවේණිකය. මෙම ආලෝකය හා සම්බන්ධ කාරණාවන් කිහිපයකි. අපගේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලෝකයේ ආලෝකයය. **"එබැවින් යේසුස්වහන්සේ ඔවුන්ට කථා කරමින්, මම ලෝකයේ ආලෝකයය. මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේ යැයි කීසේක" (යොහාන් 8:12).** උන්වහන්සේගේ දරුවන් වන අපද ජීවනයේ ආලෝකය ලැබූවන්ය. ඒ නිසා අපද ලෝකයේ ආලෝකයන්ය. **"නුඹලා ලෝකයේ ආලෝකයය" (මතෙව් 5:14).** උන්වහන්සේගේ විශ්මපත් ආලෝකයේ අපි හැසිරුනත් මේ ලෝකයේ බහුල ජන කොට්ඨාශයක තත්වය එසේ නොවේ. එය දේව වචනයෙහි මෙලෙස විස්තර වේ. **"විනිශ්චය නම් මේය, ලෝකයට ආලෝකය පැමිණ තිබෙන නමුත් මනුෂ්‍යයන්ගේ ක්‍රියා නපුරු බැවින් ඔවුන් ආලෝකයට වඩා අන්ධකාරයට ඇලුම් වූ බවය. නපුරුකම් කරන සෑම දෙනම ආලෝකයට වෛර වී, තමුන්ගේ ක්‍රියා වැරදි බව ඔප්පු නොවන පිණිස ආලෝකයට නොඑති" (යොහාන් 3:19,20).** එසේම **යොහාන් 3:21** පදයෙන් සැබෑව කරන සැබෑ ඇදිහිලිවන්තයන්ගේ තත්වය ප්‍රකාශ වේ. **"නමුත් සැබෑව කරන්නා තමන්ගේ ක්‍රියා දෙවියන්වහන්සේ තුළ කළ බව ප්‍රකාශවෙන පිණිස ආලෝකයට එන්නේ යැයි කීසේක".** නොහැදිලිවන්තයන් අන්ධකාරයෙන් ආලෝකයට නොපැමිණියත්, ආලෝකයේ ජීවත් වන ඇදහිලිවන්තයන්ගේ ක්‍රියාවන් මොනාකාර විය යුතුද?

**මතෙව් 5:15** හි සඳහන් පරිදී **" මනුෂ්‍යයන් පහනක් දල්වා කුරුණිය යට නොව පහන් රුක උඩ තබති".** මෙහි කුරුණිය යනු - ධාන්‍ය මනින මිම්මකි. (හුන්ඩුවක් වැනිය) කුරුණිය ආහාර හා සම්බන්ධයි. මෙය මනුෂ්‍යයා ජීවත් වන්නට කැමති සුඛෝපභෝගී ජීවිතය හා ආදේශ වේ. අපි දෙවියන්වහන්සේට දෙන / දිය යුතු කාලය මේ සුඛෝපභෝගී ජීවිතය තුලින් වසා දමනවා. මුදල් වැනි වුවමනාවන් නිසා දෙවියන්වහන්සේගේ කාරණාවන් අතපසු කිරීම හෙවත් කුරුණියට යට කර දැමීම

මෙයින් අදහස් වේ. "ඇඳ" යන්නෙන්ද අදහස් වන්නේ සැප පහසු ජීවිතයයි. සේවය කිරීම පසෙක තබා අපගේ ජීවිතයේ සැප පහසුකම සොයමින් ඇදහිලිවන්ත අපගේ ආලෝකයේ පහන ඇඳ යට තැබීම යන්න තව දුරටත් විග්‍රහ වේ. **"වංකවූ හිතුවක්කාර වූ පරම්පරාවක් අතරේ නුඹලා නිදොස්ව, අහිංසකව, දෙවියන්වහන්සේගේ නිර්දෝශ දරුවන්ව සිටින පිණිස කෙදිරීම්ද, විවාදද, නැතුව සියල්ල කරන්න. ඔවුන් අතරේ නුඹලා ජීවනයේ වචනය පාමින් ආලෝකවල් මෙන් ලෝකයේ දක්නා ලබන්නහුය" (පිලිප්පි 2:14-15).** ට අනුව සුභාරංචිය බෙදා දීම ඇදහිලිවන්තයාගේ සේවය වේ. එළිය ඉදිරියට වැටෙන පරිදි පහන් දැල්විය යුතුය. **"නුඹේ පහන් දල්වන කල පහන් සතේ එළිය පහන් රුක ඉස්සරහට වැටෙන්නට ඕනෑය කියා ආරොන්ට කියන්නැයි කීසේක" (ගණන්කථාව 8:2).** අපගේ ජීවිත වල තිබෙන ආලෝකය අප ඉදිරියෙන් බැබළී අපගේ පියවූ දෙවියන්වහන්සේගේ නාමයට ගෞරවය පැමිණවිය යුතුය **එපීස 5:8,14** දක්වා දේව වචන කොටස අධ්‍යයනය කිරීමෙන් ප්‍රායෝගික ජීවිතයේදී අප ජීවත් වන ආලෝකය ලෝකයා ඉදිරියෙහි බැබළවිය යුතු ආකාරය දැනගත හැකිය.

**නික්මයාම 10:22-23** දක්වා දේව වචන කොටසට අනුව තුන් දවසක් මිසරවරුන් සම්පූර්ණයෙන්ම අඳුරේ සිටි අතර ඉශ්‍රායෙල්වරුන් අතරේ ආලෝකය විය. එලෙසම අද මුළු ලෝකයම අන්ධකාරයේ විසුවත් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහාගත් අපි ආලෝකයන්ව බබළයි. අප තුල බබළන මේ ජීවනයේ ආලෝකයන් නිවී යන්ට නොදී වඩ වඩා බබළන්ට ඉඩදිය යුතුය. **"නුමුත් ධර්මිෂ්ඨයන්ගේ මාවත ඉර මුඳුන් වේලාව දක්වා වඩ වඩා ආලෝකවේගෙන යන්නා වූ අලුයම් ආලෝකය මෙන්ය" (හිතෝපදේශ 4:18)** පහනක ආලෝකය අඩුවන්නේ එහි තෙල් අඩුවන විටයි. අපගේ ජීවිත වල ආලෝකය අඩුවන්නේ අප තුල ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියාව අඩුවන විටයි. ප්‍රිය සහෝදර සහෝදරිය ඔබගේ ජීවිත සාක්ෂිය නම් ආලෝකය තුලින් ස්වර්ග යෙහි සිටින ඔබගේ පියාණන්වහන්සේට ගෞරවය පැමිණෙන පිණිස ඔබගේ ආලෝකය ලෝකයා ඉදිරියේ බබළන පිණිස උන්වහන්සේගේ මඟපෙන්වීමත්, කරුණාවත් නොඅඩුව ඔබ සමඟ වේවා. !

**- බයිබල් අධ්‍යනයක් ඇසුරෙනි -**

# වපුරන්නාගේ උපමාව.
# (මතෙව් 13:1-9)



★ බීජවලින් අදහස්වන්නේ දේව වචනයයි.
★ බිම් වර්ග 4න් අදහස්වන්නේ සතර ආකාර සිත්ය.

## 01. මඟ අසල වැටුණු බීජ - පළවන මනුෂ්‍යය කණ්ඩායම

19 වන පදය අනුව වචනය ඇසූ නමුත් තේරුම් ගත්තේ නැත. මෙම කණ්ඩායම පටන් ගැන්මේදී **යහපත් ලක්‍ෂණ කිහිපයක් පෙන්නුම් කරයි.**

- සභාවට පැමිණීම,
- වචනය ඇසීමට ඇති කැමැත්ත.
- දේශනාවට සවන් දී ගෙන සිටීම.
- දේශනාව සිතේ ධාරණය කර ගැනීම.
- එහි අඩංගු කරුණු පිළිගැනීම.

මෙම කණ්ඩායමේ **අයහපත් ලක්‍ෂණ කිහිපයක්ද පෙන්නුම් කරයි.**

- වචන තේරුම් ගැනීමට හා අවබෝධ කර ගැනීමට කිසිදු උත්සාහයක් නොදැරීම.
- සිතට කා වැදුන වචන ආරක්‍ෂා කරගැනීමට කිසිදු අධිෂ්ඨානයක් නොතිබීම හා උත්සාහයක් නොදැරීම.
- දේව වචනය ඇසූනමුත් එය දෙවියන්වහන්සේගේ වචනය ලෙස බරපතල ලෙස ගණන් නොගැනීම.
- වචනය ඇසූ නමුත් ඵල නොදැරීම. එනම් තම ජීවිතයට අදාල කර නොගැනීම.
- වචනය යක්‍ෂයා විසින් පැහැර ගැනීමට විරුද්ධව සම්පූර්ණ සටනක් නොකිරීම.

## 02. ගල් බිම් වල වපුරණ ලද බීජ - දෙවන මනුෂ්‍යය කණ්ඩායම.

20 වැනි පදයට අනුව මෙම කණ්ඩායම පළවන කණ්ඩායමට වඩා **යහපත් ලක්‍ෂණ පෙන්නුම් කරයි.**

- සභාවට පැමිණීම (වචනය ඇසුවා).
- යේසුස්වහන්සේ පිළිගැනීම. (සන්තෝෂයෙන් වචනය පිළිගත්තා)
- දේව වචනය කෙරෙහි උනන්දුවක් පෙන්වයි.
- බයිබලය රැගෙන රැස්වීමට එයි.
- තම ජීවිතය තුළ වචනයට ක්‍රියා කරන්න ඉඩ දෙයි. (21 වැනි පදය බීජ පැළවිය)
- තම ජීවිතයේ යම් වෙනසක් පෙන්වයි. (මද කලක් පවතී)
- වර්ධනය වීම සඳහා යම් සටනක් උත්සාහයක් දරයි.

මෙම කණ්ඩායම පෙන්නුම් කළ **අයහපත් ලක්ෂණ**

- දේව වචනය ජීවිතයේ ප්‍රතිපත්තියක් වශයෙන් පිළි නොගැනීම. (21 වැනි පදය මුල් නැති බැවින්)
- පවුලේ හෝ සමාජීය පීඩනයට හසු වීම.
- වචනය නිසා ජීවිතයේ ඇති වුන වෙනසට විරුද්ධව පැන නගින විරුද්ධාවාදීන්ට මුහුණ දීමට ඇති නොහැකියාව.
- දෙවියන්වහන්සේට වඩා ලෝකයාට භය වීම. (21 වැනි පදය පීඩාවක් පැමිණි කෙනෙහිම බාධාවන්නේය)

## 03. කටු අතරෙහි වැටුණු බීජ - තුන් වැනි මනුෂ්‍යය කණ්ඩායම

22 වැනි පදය අනුව මෙම මනුෂ්‍යයන් වඩා **යහපත් ගති ලක්ෂණ පෙන්විය.**

- සභාවට පැමිණෙයි. (සියලු රැස්වීම් වලට විය හැක)
- යේසුස්වහන්සේ හා වචනය පිළිගනී.
- බයිබලය කියවීම ආරම්භ කළා.
- ජීවිතය වෙනස් වෙයි.
- සේවය කරයි.
- දේව වචනයට ක්‍රියා කිරීමට ඉඩ දෙයි.
- ආත්මිකව වර්ධනය වීමට උත්සහ කරයි.
- යම් කාලයක් සභාවේ ක්‍රියාකාරීව ආත්මික පුද්ගලයෙකු කැපී පෙනෙයි.

මෙම මනුෂ්‍යාගේ **අයහපත් ලක්ෂණ**

- ලෝකයේ තිබෙන තරඟකාරී භාවයට වහල් වීම.
- ලෝකාකාර ක්‍රමය හා දෙවියන්වහන්සේගේ අදහස තේරුම් නොගැනීම
- වස්තු තෘෂ්ණාව ජය නොගැනීම.
- ලෞකික මිනිසුන් වඩා ආශ්‍රය කිරීම.
- ක්‍රමානුකූලව ලෝකාකාර මිනිසුන්ගේ අදහස් වලට යට වීම.
- දෙවියන්වහන්සේට වඩා ලෝකයට ප්‍රේම කිරීම.
- ලෞකික ගරුබුහුමන් වලට ආශා වීම.

## 04 සරු බිමෙහි වපුරණ ලද බීජ - හතරවන මනුෂ්‍යය කණ්ඩායම

23 වැනි පදයට අනුව මෙම කණ්ඩායම **යහපත් ලක්ෂණ**

- සභාවට පැමිණෙයි.
- බයිබලය කියවයි.
- ආත්මික වර්ධනය වෙයි.
- වචනය ජීවිතයට අදාල කර ගනියි. (ඵල දැරීම)
- යේසුස්වහන්සේ අදහා ගනියි.
- ආත්මිකව වර්ධනය වෙයි.
- සේවය කරයි.
- ලෝකාකාර සියළු රැවටිලි ප්‍රතික්ෂේප කරයි.
- ලෝකයෙන් වෙන්ව ජීවත් වෙයි.
- අන් අයට හඳුනාගත හැකි ආකාරයෙන් ජීවිත වෙනසක් පෙන්නුම් කරයි.
- යේසුස්වහන්සේගේ අදහාගත් අයෙකු ලෙස අන් අයට බලපෑමක් ඇති කරයි.
- යක්ෂයාට හා ඔහුගේ උපක්‍රම හඳුනා ගෙන ඔහුට සාර්ථකව මුහුණ දෙයි.
- සාර්ථක වචනය අනුව ක්‍රියාකරන්නෙකු බවට පත් වෙයි.

ඔබත් වචනය අසන්නෙකු පමණක් නොවී වචනය අනුව ජීවත් වන්නෙකු වන්න.

**- ගුරු ගරු -**

# කිතුණු සහභාගීකම - ක්‍රියා 2:42

කිතුනුවන් අතර පවතින ගුණාංග අතරින් පුරාණයේ සිට කැපී පෙනෙන ගති ලක්‍ෂණය වන්නේ සහභාගීකමයි. එනම් එක්රැස් වීමයි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරුවා හා ස්වාමින්වහන්සේ ලෙස අදහන අය නමස්කාර කරන පිණිස, බයිබලය ඉගෙන ගැනීම පිණිස හෝ විවාහයකදී හෝ උපන් දිනයකදී හෝ සංවත්සරයකදී හෝ අවමංගල්‍යයකදී හෝ වෙනයම් අවස්ථාවලදී එක් රැස් වී සහභාගීකම් පැවැත්වීම බහුල දක්නට ලැබේ. එය දේව වචනය තුල ද වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර එය අපට ආදර්ශයක්ද සපයයි. එසේ රැස්වන විට අප එකිනෙකාට කල යුතු දේ බයිබලයේ අලුත් ගිවිසුම පුරාවට අපට මඟපෙන්වීමක් කරයි. අපි එකිනෙකා රැස්වී සහභාගීකමේ පැවැත්වීමේදී අප කළ යුත්තේ කුමක්ද?

01. එකිනෙකාට ප්‍රේම කරන්න.
    - **(යොහාන් 13:34) (රෝම 13:8)**

02. එකිනෙකාට ශුද්ධ සිඹීමකින් ආචාර කරන්න. - **(රෝම 16:16)**

03. එකිනෙකා සමඟ සමාදානය පවත්වා ගන්න. - **(මාර්ක් 9:50)**

04. එකිනෙකාට සේවය කරන්න. **(ගලාති 5:13)**

05. එකිනෙකා වැඩි දියුණු කරන්න (ගොඩ නැගීම). - **(රෝම 14:19)**

06. එකිනෙකාට දැනමුතුකම් දෙන්න.
    - **(රෝම 15:14)**

07. එකිනෙකාට කමාව දෙන්න.
    - **(එපීස 4:32)**

08. එකිනෙකාට යටත් වන්න. - **(එපීස 5:21)**

09. එකිනෙකා කෙරෙහි ප්‍රේමයෙන් ඉවසන්න.
    - **(එපීස 4:2)**

10. එකිනෙකාට සනසන්න.
    - **(1 තෙසලෝනික 4:18)**

11. එකිනෙකා අනුශාසනා කරන්න.
    - **(හෙබ්‍රෙව් 3:13)**

12. එකිනෙකාට ආගන්තුක සත්කාර කරන්න.
    - **(1 පේත්‍රුස් 4:9)**

13. එකිනෙකාට ගෞරව කරන්න.
    - **(රෝම 12:10)**

14. එකිනෙකා සිතේ තබා ගන්න.
    - **(හෙබ්‍රෙව් 10: 24)**

15. එකිනෙකාට ඉඩ දෙන්න.
    - **(1 කොරින්ති 11:33)**

16. එකිනෙකා පිළිගන්න. - **(රෝම 15:7)**

17. එකිනෙකාට අනුකම්පා කරන්න.
    - **(1 පේත්‍රුස් 3:8)**

18. එකිනෙකාට පාපොච්චාරණය කරන්න.
    - **(යාකොබ් 5:16)**

19. එකිනෙකා උදෙසා යාච්ඤා කරන්න.
    - **(යාකොබ් 5:16)**

20 එකිනෙකාට සෙනෙහෙවන්ත වන්න.
    - **(රෝම 12:10)**

ඔබට මෙසේ කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේ උපකාර කරන සේක්වා.

**- බයිබල් අධ්‍යයනයක් ඇසුරෙනි -**

# ඇයි අප දෙවියන්වහන්සේට දිය යුත්තේ ?

දෙවියන්වහන්සේගේ දරුවන් විසින් දෙවියන්වහන්සේට තමන් ආදායමෙන් කොටසක් දෙවියන්වහන්සේට පූජා කළ යුතු බව බයිබලය පුරාවට අපට මඟපෙන්වයි. එය දෙවියන්වහන්සේගේ කොටස ලෙස හඳුන්වයි. එය පරණ ගිවිසුමේ දසයෙන් එකක් ලෙසද, අලුත් ගිවිසුමේ ප්‍රමාණාත්මක අගයක් දක්වන්නේ නැත. එය තමන් දෙවියන්වහන්සේට ප්‍රේම කරන ප්‍රමාණයට දෙවියන්වහන්සේට පූජා කළ යුතු යැයි හැඟේ. **ඇයි අප දෙවියන්වහන්සේට දිය යුත්තේ?** එය අප දේව වචනයේ ආලෝකයෙන් සොයා දැන ගමු.

01. අප දෙවියන්වහන්සේට දීම මඟින් දෙවියන්වහන්සේ අපගේ දිනපතා සැපයුම්කරුවාණන් ලෙස අප පිළිගනියි. **(1 ලේකම් 29:14-15)**

02. අප දෙවියන්වහන්සේට දීම මඟින් අප කරන නමස්කාරය හා ප්‍රශංසාව සැබෑ එකක් බව ඔප්පු වෙයි. **(2 සාමුවෙල් 24:24)**

03. අප දෙවියන්වහන්සේට දීම මඟින් අපගේ ඕනෑම අවශ්‍යතාවයක් සැපයීමට දෙවියන්වහන්සේට හැකි බවට තිබෙන අපගේ ඇදහිල්ල ප්‍රකාශ කරයි. **(හිතෝපදේශ 11:25 / මලාකි 3:20)**

04. දෙවියන්වහන්සේට දීම මඟින් අපගේ ආරක්ෂාව දෙවියන්වහන්සේ මත රඳා පවතින බව පෙන්නුම් කරයි. **(මලාකි 3:11)**

05. දෙවියන්වහන්සේට දීම මඟින් අප දෙවියන්වහන්සේටත්, උන්වහන්සේගේ සේව යටත්, ප්‍රේම කරන බව පෙන්නුම් කරයි. **(1 කොරින්ති 9:14)**

06. අප දෙවියන්වහන්සේට දීම මඟින් නිරයට යන මිනිසුන් පිළිබඳ අපට කැක්කුමක් තිබෙන බව පෙන්නුම් කරයි. **(රෝම 10:14-15)**

07. අප දෙවියන්වහන්සේට දීම මඟින් ආත්මාර්ථකාමීත්වය ජය ගැනීම හා හදවතේ ප්‍රීතිය රඳවා ගැනීමට හැකි වෙයි. **(1 ලේකම් 24:21-22)**

## අප කොපමණ දෙවියන්වහන්සේට දිය යුතුද?

01. අපට රිදෙන දැනෙන තරම් දිය යුතුයි. **(ලූක් 21:1-4)**

02. අඩුතරමේ 10% ට වඩා වැඩි ප්‍රමාණයක් දිය යුතුය. **(මලාකි 3:8)**

**මසුරු ලෙස වපුරන්නා මසුරු ලෙස කපා ගන්නේය. නොමසුරු ලෙස වපුරන්නා නොමසුරු ලෙස කපාගන්නේය. කණගාටුවෙන්වත්, ඕනෑම නිසාවත් නොව එක් එක්කෙනා තමතමාගේ සිතින් නියම කරගත් ලෙස දේවා. මක්නිසාද සතුට සිතින් දෙන්නාට දෙවියන්වහන්සේ ප්‍රේම කරන සේක. (2 කොරින්ති 9:6-7)**

**- බයිබල් අධ්‍යයනයක් ඇසුරෙනි -**

# අපි කිතුණුවෝ, හැසිරෙමුද කෙසේ?

(දෙවැනි කොටස)

එදාමෙදා තුර ජීවත් වූ සියලු කිතුණු ඇදහිලිවතුන් වෙත දෙවියන්වහන්සේගෙන් වූ උච්චතම අභියෝගය කුමක්දැයි පසුගිය කලාපය තුළින් අපි සිහිපත් කෙළෙමු.

**"තමන්වහන්සේගේ රාජ්‍යයටත් මහිමයටත් නුඹලා කැඳවනු ලැබූ දෙවියන්වහන්සේට ඔබින ලෙස නුඹලා හැසිරෙන හැටියට" (1 තෙසලෝනික 2:11)**, පාපයට වැටී සිටින ජම්මික වූ පාපකාරී ස්වභාවයක් ඇති මිනිසෙකු, සෑම අතින්ම පරිපූර්ණ අති ශුද්ධ දෙවියන්වහන්සේට ඔබින ලෙස හැසිරිය හැකිද? ගැඹුරින් කල්පනා කල විට එය කෙසේවත් ඉටු කල නොහැකි අභියෝගයක් ලෙස හැඟේ. එහෙත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහාගෙන ගැලවීම ලබා දෙවියන්වහන්සේගේ ආත්මයාණන් තමා තුළ වැඩ සිටින සෑම ඇදහිලිවන්තෙකුගෙන්ම දෙවියන්වහන්සේ බලාපොරොත්තු වන්නේ උන්වහන්සේට ඔබින ආකාර ජීවිත රටාවකි. **"අපගේ පවුලේ ගෞරවයට හෝ දෙමව්පියන්ගේ ගෞරවයට ඔබින දෑ කරන්නට"** අප දෙමව්පියන්ගෙන් ගුරුහරුකම් ලැබීමුව. දැන් දේව දරුවන් හැටියට දෙවියන්වහන්සේට ඔබින ලෙස හැසිරෙන මෙන් අපට අවවාද කරන්නේ අපගේ දෙවියන්වහන්සේය. මේ මාතෘකාව සාකච්ඡා කිරීම පසුගිය සඟරාව තුළින් අපි ආරම්භ කෙළෙමු.

අපගේ දෙවියන්වහන්සේට ඔබින ලෙස හැසිරීමේ පියවර දෙකක් සාකච්ඡා කලා ඔබට මතක ඇත.

### 01. ජීවනයේ අළුත් කමින් හැසිරීම. - රෝම 6:4

අපට සිදුවී තිබෙන්නේ යේසුස්වහන්සේ ඇදහීම පමණක් නොව උන්වහන්සේගේ මරණය වළලනු ලැබීම සහ මළවුන්ගෙන් නැගිටීම සමග බද්ධ වීමකි. මේ ආත්මික ශෛල්‍යකර්ම නිසා ජීවනයේ අලුත් කමින් හැසිරීමට අපට හැකිවේ.

### 02. ඇදහිල්ලෙන් හැසිරීම - 2 කොරින්ති 5:7

එම පදයේ පසුබිම් අනුව ඇදහිල්ලෙන් හැසිරීම යනු මේ ජීවිතය කෙලවරදී නියත ලෙසම ස්වර්ගයට පිවිසෙන බවට ඇති සහතික කම මත අපගේ ජීවිතය ගෙන යාමයි.

අද එතැන් සිට.....

### 3. ආත්මයාණන්වහන්සේ කරණකොට ගෙන හැසිරීම - ගලාති 5:16

ඇදහිලිවන්ත අප සිටින්නේ තනිව නොවේ. අප තුළ දෙවියන්වහන්සේගේ ආත්මයාණන් වැඩ සිටින සේක. මෙය අපගේ ආත්මික ජීවිතයේ ජම්මික උරුමයයි. ශුද්ධාත්මයාණන් තුළ ජීවත්වීම කිතුණුවෙක් සතු සුපිරි අත්දැකීමක් නොවේ. ආත්ම පූර්ණ ජීවිතය ස්වල්ප දෙනෙක්ට පමණක් සීමා වූ සුපිරි ගණයේ ජීවිතයක්ද නොවේ. ගැලවුම ලැබූ දා පටන් ශුද්ධාත්මයාණන් අප තුළ වැඩ සිටින නිසා ආත්මයාණන් තුළ ජීවත් වීම කිතුණු ඇදහිලිවතෙකුට සමානය. ස්වභාවික දෙයක් විය යුතුය. ඔබ මෙය ඇදහිල්ලෙන් පිළිගන්න. ඔබ තුළ දෙවියන්වහන්සේගේ ආත්මයාණන් වැඩසිටින බව විශ්වාස කරන්න උන්වහන්සේට ඔබගේ ජීවිතයේ පාලනය භාර දෙන්නට කැමති වන්න. ශුද්ධාත්මයාණන් ඔබගේ ජීවිතයේ කරන - නොකරන දේ පිළිබඳව දේව වචනයෙන් ඔබ දැනුවත් විය යුතුය.

## ශුද්ධාත්මයාණන් කරන දේ හෙවත් ශුද්ධාත්මයාණන්ගේ සේවය

01. **යොහාන් 16:8** - පාපය, ධර්මිෂ්ඨකම සහ පැමිණෙන විනිශ්චය ගැන හඟවා දෙයි.

02. **යොහාන් 3:6,7** - යේසුස්වහන්සේ අදහා ගන්න කෙනෙකු අලුතින් ඉපදීමට සලස්වයි.

03. **යොහාන් 14:17** - ඔබ තුළ වැඩ වාසය කරයි.

04. **යොහාන් 14: 26** - ඔබට සෑම දේ උගන්වයි.

05. **යොහාන් 16: 13** - සත්‍යයකරා ඔබව මඟ පෙන්වයි.

06. **යොහාන් 16: 14** - ක්‍රිස්තුස්වහන්සේව ගෞරවයට පත් කරයි.

07. **යොහාන් 16:14** - ක්‍රිස්තුස්වහන්සේ සතු දේ රැගෙන අපට පෙන්වා දෙයි.

08. **ක්‍රියා 1:8** - යේසුස්වහන්සේ උදෙසා සාක්ෂිකරුවන් වීම පිණිස අප බලවත් කරයි.

09. **1 කොරින්ති 12:13** - අප ගැලවීම ලබන මොහොතේම අපව ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයට තුළට බව්තීස්ම කරනු ලබයි.

10. **1 කොරින්ති 12:4,11** - ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වන සභාවේ අප එකිනෙකාට සේවය පිණිස අවැසි වන දීමනා ලබා දෙයි.

මේ අයුරින් ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් නොකරන දේ ගැනද වචනයෙන් අප දැනගත යුතුය. මන්ද බොහෝ නූතන කිතුණුවෝ මේ ගැන දේව වචනයානුකූල අවබෝධයක් නොමැතිව තමා කරන කියන සෑම දේම ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියා යැයි ප්‍රකාශ කරති.

### ශුද්ධාත්මයාණන් නොකරන දෑ

01. **යොහාන් 16:14** - උන්වහන්සේ තමා ගැනම කථා නොකරයි.

02. **1 කොරින්ති 14:23** - අප තුළ හෝ අප අතර වියවුලක් ඇති නොකරයි.

03. **2 තිමෝති 1:7** - අප තුළ බිය ඇති නොකරවයි.

04. **යෙසායා 42:1,2** - අධික කෑ කෝ ගැසීමට අප නොපොළඹවයි.

ඉහත කරුණුවලින් ගම්‍ය වන්නේ ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරීම අලංකාර, ආකර්ශණීය කැපී පෙනෙන ශුද්ධ ජීවිතයක් බවයි. **"සෝදනු ලැබූ, ශුද්ධකරනු ලැබූ, ධර්මිෂ්ඨකරනු ලැබූ"** ජීවිතයක් අපට ලබා දෙන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේය **(1 කොරින්ති 6:11).** මෙම ඉහත පැහැදිලි කිරීම් වලට අනුව ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන හැසිරීම කුමක්දැයි අපි තේරුම් ගත යුතු වෙමු.

## 04. ප්‍රේමයෙන් හැසිරීම. - එපීස 5:2

**"ක්‍රිස්තුස්වහන්සේ නුඹලාට ප්‍රේමකොට සුවඳක් පිණිස දෙවියන්වහන්සේට පූජාවක්ද, යාගයක්ද කොට අප වෙනුවට තමන්ම පාවාදුන්නාක්මෙන්ම නුඹලාත් ප්‍රේමයෙන් හැසිරියල්ලා"** යේසුස්වහන්සේ පැවසූ රන් අණ ගැන අප අසා ඇත්තෙමු. **"නුඹේ මුළු ආත්මයෙන්ද, ශක්තියෙන්ද, බුද්ධියෙන්ද, නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේට ප්‍රේමකරන්න. නුඹට මෙන් නුඹේ අසල්වාසියාට ප්‍රේමකරන්න"** යේසුස්වහන්සේ ප්‍රකාශ කළේ එම රන් අණ දෙකම එක සමාන බවයි. එම නිසා අප දෙවියන්වහන්සේට දක්වන ප්‍රේමයේ තරම අප ඇදිහිලිවන්ත සහෝදර සහෝදරියන් හට පෙන්වන ප්‍රේමයේ තරමෙන් මැනගත හැක. අපි දෙවියන්වහන්සේට ප්‍රේම කරන බව ප්‍රකාශ කරන නමුත් සෙසු සහෝදර සහෝදරියන්ට ප්‍රේම කිරීමට අපොහොසත්

වෙමු. මේ නිසා අපගේ කිතුණු ජීවිතයේ ඇති සත්‍යවාදී බව ප්‍රේමයෙන් හැසිරීම මඟින් ගැඹුරු සමීක්ෂණයකට භාජනය වේ. **"නුඹලා කරන සියල්ලම ප්‍රේමයෙන් කරනු ලැබේවා" (1 කොරින්ති 16:14). "ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථා කරමින්" (එපීස 4:15).** මේ වචනවලට අනුව අප කරන කියන හැමදෙයක් තුලම ගැබ්ව තිබිය යුත්තේ ප්‍රේමයයි. කිතුණු ඇදහිලිවන්ත ජීවිතය ඉතා ඉහළ ප්‍රමිතියකින් යුතු එකක් බව අපට මින් පැහැදිලි වේ. අපගේ ජීවිතයේ පදනම ප්‍රේමය විය යුතුය. මේ පිළිබඳව අලුත් ගිවිසුම් ලියවිල්ලෙහි මොනතරම් වාර ගණනක් ලියැවී තිබේද? මේ අත්‍යාවශ්‍යයම දෙයයි. මේ කිතුණු ජීවිතයේ සාරය සහ හරයයි. ප්‍රේමයෙන් තොර කිතුණු ජීවිතයක් නොමැත. **"ප්‍රේමය බොහෝ ඉවසිලිවන්තය, ගුණවන්තය, ප්‍රේමය ඊර්ෂ්‍යාවන්නේ නැත, ප්‍රේමය පාරට්ටුකරගන්නේ නැත, උඩගුවෙන්නේ නැත, අශෝභන ලෙස හැසිරෙන්නේ නැත, තමාගේම කාරණ සොයන්නේ නැත, කෝපවන්නේ නැත, නපුර ගණන්ගන්නේ නැත" (1 කොරින්ති 13:4,5)** මෙන්න ප්‍රේමයේ ගති ලක්ෂණ. ඇදහිලිවතුන් ලෙස අප ප්‍රේමයේ හැසිරෙන්නේ කෙසේදැයි තේරුම්ගැනීමට මෙම ශුද්ධ ලියවිලි පාඨය හොඳින් කියවා තේරුම්ගත යුතුය. මෙය සුපිරි කිතුණුවන්ට අයිති අවවාදයක් නොව හැම කිතුණු ඇදහිලිවතෙකුටම අත්‍යාවශ්‍යවූ ගති ලක්ෂණයි. මේවා නොසලකා සිටින්නේ නම් අපි අපම රවටා ගන්නාවූ අඥානයෝ වෙමු. මෙවැනි චරිත ලක්ෂණ ඇතුව සිටීමට නම් අපි තමකමට මැරී සිටිය යුත්තෙමු. දෙවියන්වහන්සේට ඔබින ලෙස හැසිරීම යනු ප්‍රේමයෙන් හැසිරීමය.

## 05. ආලෝකයෙහි හැසිරීම - 1 යොහාන් 1:7

**"උන්වහන්සේ ආලෝකයේ සිටින්නාසේම අපිත් ආලෝකයෙහි හැසිරෙමු නම්, අපට එකිනෙකා සමඟ පංගුකාරකම ඇත්තේය".** ආලෝකයෙහි හැසිරීම ඇදහිලිවන්තයෙකුට දෙවියන්වහන්සේ නියම කර තිබෙන හැසිරීම් රටාවේ ඉතා වැදගත් එකකි. වේදිකාවක රඟන පුද්ගලයෙකුට විදුලි ආලෝක කදම්භයක් පතිතවන විට පමණක් එම තැනැත්තාව නරඹන්නන් හට හොඳින් පෙනේ. මේ ආකාරයට අපත්, ජීවිතය කැමති රඟමඩලේ දේව වචනය නැමැති ආලෝක කදම්භය යටට පිවිසිය යුත්තෙමු. අප මත පතිතවන ආලෝක කදම්භය නම් දෙවියන්වහන්සේගේ වචනයයි. එනම් ශුද්ධ බයිබලයයි. අප කරන කියන හැම දෙයකම හොඳ නරක තීරණය වන්නේ දේව වචනය නම් ආලෝකයේ ආධාරයෙනි. අපගේ ජීවිත මතට දේව වචනයේ ආලෝකය පතිත වූ විට ජීවිතයේ ඇති සියලු දෑ හෙලිකරනු ලබයි, සෝදිසි කරනු ලබයි. දේව වචන ආලෝකය තුළින් බැලූ විට අපගේ ජීවිත කෙසේද? අපගේ සිත කෙසේද? අපගේ ආත්මය කෙසේද? ගැලවීම ලැබීමට පෙර තිබුණු පැරණි ජම්මික ජීවිතයේ දුර්ගුණ, මිත්‍යා විශ්වාස සහ අඥානවූ දේ තවමත් අප ජීවිතයේ රැඳී තිබේද? අපි දේව වචනයෙහි ආලෝකයෙහි හැසිරෙමු නම්, අප දෙස බලන සැමට අපව හොඳින් පෙනේ. සඟවන්නට දෙයක් නැතිව ජීවත් වීම ආලෝකයෙහි හැසිරීමයි. යේසුස්වහන්සේ කළ ප්‍රකාශනය මෙහිදී අදාල වෙයි. **"නපුරුකම් කරන සැමදෙනා ආලෝකයට වෛර වී තමුන්ගේ ක්‍රියා වැරදි බව ඔප්පු නොවන පිණිස ආලෝකයට නොඑති" (යොහාන් 3:20).** දේව වචනයට ඔබගේ ජීවතය මත පතිතවන්නට ඉඩ දෙන්න. ඊට පටහැනි වූ දේ අප ජීවිත වලින් පහවේවා! පාපය නැමැති තිත් පැල්ලම් පෙනෙන විට ඒවා ඉවත් කිරීම අපගේ වගකීමයි. අපි කරන කියන හැම දෙයටම දේව වචනමය හේතුවක් තිබිය යුතුය. දේව වචන අනුමත නොකර සිටිමු.

**- නෙවිල් ජයසුන්දර -**

**(මීලඟ කොටස ලබන කලාපයෙන්)**

# සහභාගීකමේ සතුරෝ.

කිතුණුවන්ගේ සහභාගීත්වය මිහිරිය, ප්‍රීතිමත්ය, නිදහස්ය, ධෛර්ය උපදවයි. එහෙත් එම තත්වය විනාශ කරන සතුරන්ද සිටින බව අප මතක තබා ගත යුතුය. දේවවචනයේ ආලෝකයෙහි එම සතුරන් හඳුනා ගනිමු. අපි එක්රැස් වූ විට නොකල යුතු දේ.

01. එකිනෙකා හෙලා (විනිශ්චය නොකරන්න) නොදකින්න.
**- (රෝම 14:13)**

02. එකිනෙකාට එරෙහිව උඩඟු නොවන්න. **- (1 කොරින්ති 4:6)**

03. එකිනෙකාට බොරු නොකියන්න.
**- (කොලොස්සි 3:9)**

04. එකිනෙකාට විරුද්ධව කතා නොකරන්න. **- (යාකොබ් 4:11)**

05. එකිනෙකාට විරුද්ධව නොකොඳුරන් න. **- (යාකොබ් 5:9)**

06. එකිනෙකාගෙන් ගෞරවය නොසොයන්න. **- (යොහාන් 5:44)**

07 එකිනෙකා කෝප නොකරන්න.
**- (ගලාති 5:25)**

08. එකිනෙකාට ඊර්ෂ්‍යා නොකරන්න
**- (ගලාති 5:25)**

09. එකිනෙකාට වෛර නොකරන්න.
**- (තීතස් 3:3)**

10. එකිනෙකා සපා නොකන්න.
**- (ගලාති 5:15)**

එසේ කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේ අප සැමට උපකාර කරන සේක්වා.



**- බයිබල් අධ්‍යයනයක් ඇසුරෙනි -**

# අප මධ්‍යස්ථානයේ පැවැත්වෙන රැස්වීම්.

## ඉරිදා

පෙ.ව 8.15 - 9.15 - ඉරිදා පාසැල
අවුරුදු 3-18 දක්වා ළමුන් සඳහා

පෙ.ව 9.30 - 12.00 - රොටි කැඩීමේ හා නමස්කාර රැස්වීම
(සිංහල , දෙමළ , ඉංග්‍රීසි)

ප.ව 4.00 - 5.00 - සුභාරංචි රැස්වීම - (සිංහල)

ප.ව. 6.00 - 7.00 - සුභාරංචි රැස්වීම - (ඉංග්‍රීසි)

## අඟහරුවාදා

ප.ව 6.30 - 7.30 - සුභාරංචි රැස්වීම
(දෙමළ)

## බදාදා

ප.ව 6.00 - 7.30 - යාච්ඤා රැස්වීම
අසනීප අය සඳහා තෙල් ආලේප කර
යාච්ඤා කිරීම

## සිකුරාදා

ප.ව 6.00 - 7.30 - බයිබල් අධ්‍යයනය

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2581901 / 077 8813197
www.christianfellowshipcentre.com

NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com